# 1 අපේ පැරණි ජන ජීවිතය

### හැඳින්වීම

අපේ රටේ ඉතිහාසය ගැන තොරතුරු දැන ගැනීමට අපි බොහෝ ආශා කරමු. ඒ නිසා ඉතිහාසය පිළිබඳ ලියා ඇති පොත් පත්, පත්තර, සඟරා, කතන්දර ආදිය නිතර කියවීමට අපි පුරුදු වී සිටිමු. අතීතයේ අපේ රට පාලනය කළ රජවරුන්, භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික නායකයන්, පාලන කටයුතුවලට සම්බන්ධ නිලධාරීන් ආදි පිරිස් පිළිබඳ මෙන්ම වැව් අමුණු ආදිය ගැන ද මේ වන විට අපි බොහෝ තොරතුරු දනිමු. මේ පාඩම යටතේ අතීතයේ අපේ රටේ ජීවත් වූ වැසියන්ගේ ජන ජීවිතයට අදාළ තොරතුරු ඔබට ඉදිරිපත් කෙරේ.

## ආර්ථිකය

අතීතයේ දී අපේ රටේ ජීවත් වූ ජනතාව ජීවනෝපාය සඳහා විවිධ වෘත්තීන්වල නියැලුණහ. ගොවිතැන, වෙළෙඳාම, විවිධ කර්මාන්ත, සත්ත්ව පාලනය එවැනි වෘත්තීන්වලට උදහරණ වේ. ඒ අනුව පුරාණ ජීවන රටාව ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ සිදු වූ බව පෙනේ.


- ☆ කෘෂිකර්මාන්තය
- ☆ කර්මාන්ත
- ☆ වෙළෙඳාම

## කෘෂිකර්මාන්තය

අතීතයේ අපේ රටේ සිටි බොහෝ දෙනෙකු ජීවත් වූයේ ගම්වල ය. වර්තමාන ජනතාව මෙන් නොව ඔවුන් ඉතා සරල ජීවිත ගත කළ පිරිසකි. ඔවුන්ගේ අවශ්‍යතා ද සීමිත විය. යැපීම සඳහා අවශ්‍ය වන ආහාර පාන නිෂ්පාදනය කර ගැනීම, ඔවුන් මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් විය. මෙම අභියෝගය ජය ගැනීමට බොහෝදෙනා කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්හ. එකල කෘෂිකර්මාන්තය, හේන් වගාව හෙවත් ගොඩ ගොවිතැන හා කුඹුරු වගාව හෙවත් මඩ ගොවිතැන වශයෙන් ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු විය.

## හේන් වගාව

හේන් ගොවිතැන ගොඩ ගොවිතැන යනුවෙන් ද හැඳින්වේ. එදිනෙදා ජීවිතයේ යැපීම සඳහා අවශ්‍ය ධාන්‍ය, එළවළු, අල වර්ග වැනි දෑ හේන්වල වගා කෙරිණි. වර්ෂා ජලයෙන් හේන් වගා කටයුතු සිදු කර ඇත.






නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හේන් වගාව ලෝකයේ පැරණි ම ගොවිතැන් ක්‍රමය ලෙස ද සැලකේ. ශ්‍රී ලංකාවේ ද හේන් ගොවිතැන වඩාත් පැරණි ගොවිතැන් ක්‍රමයක් ලෙස සැලකිය හැකි ය.

කැලෑ ගිනි තබා එළි පෙහෙළි කර සකස් කරගන්නා බිමක් හේනක් ලෙස හැඳින්වේ. උම්මග්ග ජාතකයේ **"සේන්"** යනුවෙන් ද සෙල්ලිපිවල **"පිටබිම්"** යනුවෙන් ද අතීතයේ පැවති හේන් හඳුන්වා ඇත. හේනක් සඳහා තෝරාගන්නේ මහ කැලෑවේ බිමකි. එය ගොවීන් වාසය කරන ප්‍රදේශයට තරමක් ඈතින් පිහිටා තිබිණි. හේනක් කෙටීම එක් ගොවියකුගේ හෝ සාමූහිකව කිහිප දෙනෙකුගේ ශ්‍රමයෙන් ද සිදු කර ඇත.

කාවන්තිස්ස රාජ්‍ය සමයේ රුහුණු ප්‍රදේශයේ පිහිටි ගිරි නම් ජනපදයේ නිසෙල්විටිය ගමේ වාසය කළ එක්තරා පවුලක සහෝදරයන් පස් දෙනෙකු එකතු වී වනයක් එළි පෙහෙළි කර උඳු වැපිරීමට හේනක් සකස් කිරීම පිළිබඳ කතා පුවතක් මහාවංසයේ සඳහන් වේ.

හේනක් සකස් කර ගැනීමේ දී ගොවියාට ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කිරීමට සිදු විය. අස්වැන්න නෙළා ගැනීම දක්වා හේන් ගොවියා කළ යුතු කාර්යයන් කිහිපයකි.

**හේන් වගා කළ ආකාරය:**

1. හේනක් සකස් කිරීම සඳහා සුදුසු බිමක් තෝරා ගැනීම.
2. කැලය කපා සුද්ද පවිත්‍ර කොට හේන ගිනි තැබීම.
3. දැව දඬු ආදිය පුළුස්සා බිම සැකසීම.

එලෙස අලුතින් ගිනි තබා සකස් කර ගත් භූමිය නවදැලි හේනක් ලෙස හැඳින්වේ.

එවැනි හේන් ඉතා සරුසාර කෘෂි බිම් ලෙස සැලකේ.



රූපය 1.1 නවදැලිහේන

4. අලින්, ඌරන්, ගෝනුන්, ඉත්තෑවුන්, වඳුරන් වැනි වන සතුන්ගෙන් හේන ආරක්ෂා කර ගැනීමටත් අස්වැන්න නෙළා ගන්නා තුරු හේන හොඳින් රැකබලා ගැනීමටත් හේන් ගොවියාට සිදු විය. එහි දී හේන ආරක්ෂා කර ගැනීමට අතීත ගොවීහු විවිධ ක්‍රම අනුගමනය කළහ.

- ✦ දඬු වැට තැනවීම
- ✦ ගිනිමැල ගැසීම
- ✦ පැල් රැකීම

5. වර්ෂා කාලය එළඹෙන විට හේන්වල භෝග වගා කිරීම ඇරඹිණි. ඒවායේ බොහෝ විට කටුසර භෝග වගා කර ඇත. තණහාල්, මෙනේරි, කුරක්කන් වැනි ධාන්‍ය වර්ග එවැනි කටුසර භෝග කිහිපයකි. එසේ ම මුං, මෑ, අමු, ඉඟුරු, අබ, ඇල් වී, තල, කපු, උක් ආදිය ද තිබ්බටු, වම්බටු, අළුපුහුල්, වට්ටක්කා වැනි එළවළු ද ඉන්නල, බතල වැනි අල වර්ග ද හේන්වල වගා කළ බව සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වේ.

මුල් කාලයේ දී වී වගාව ද හේන් වගාවක් ලෙස පැවතුණි. හේන්වල වගා කළ වී, ඇල් වී ලෙස හඳුන්වයි. ඇල් වී වගා කළ කෙත් හෙවත් හේන් ඇල් හේන් යනුවෙන් හඳුන්වයි. ඇල් හාල් පිළිබඳ පැරණි සාහිත්‍ය කෘතිවල සඳහන් වේ. දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමාරයාට එම නම තබන ලද්දේ ඒ කුමරා උපන් කාලයේ ඇල් වී අස්වැන්න ඉහළ ගිය නිසා යැයි ***සීහළවත්ථු*** නම් පැරණි ග්‍රන්ථයේ දැක්වේ. සාලි යනු ඇල් වීවලට යොදන තවත් නමකි. අතීතයේ ඇල් වී ඇතැම් විට කුඹුරුවල ද වගා කෙරිණ. රත් ඇල්, බිබිළි ඇල්, ඉඳි ඇල් ආදිය හේන්වල වගා කළ ඇල් වීවලට උදහරණ වේ.

6. එක් වරක් හෝ දෙවරක් වගා කර අස්වැන්න නෙළා ගැනීමෙන් පසුව හේන අතහැර දමයි. හේන් බිම නැවතත් කැලෑවක් බවට පත්වන අතර හේන් ගොවියෝ වගා කටයුතු සඳහා වෙනත් බිම් ප්‍රදේශයක් තෝරා ගත්හ.

හේන් වගා කටයුතු සඳහා කැති, උදලු, දෑ කැති වැනි සරල උපකරණ භාවිත කර ඇත.



**රූපය 1.2 පැරණි යුගයේ භාවිත කළ කෘෂි උපකරණ කිහිපයක්**

හේන් වගාවේ දී ගොවියා භාවිත කළ විවිධ වචන ද අපට හමු වේ. අනුරාධපුර යුගය තරම් ඈත කාලයේ භාවිත කළ එබඳු වචන අද දක්නට නැතත් පහත සඳහන් මෑත කාලීන වචන හේන් බස් වහර තේරුම් ගැනීමට ප්‍රයෝජනවත් ය.

නවදැලි හේන - අලුතින් ගිනිතබා සකස් කළ හේන

ගිනි යාතිකාව - හේන ගිනිතැබීමට පෙර සතුන් පන්නා හැරීමට සිදු කළ කෑ ගැසීම

හැලි කටා - හිසට වළඳක් නමා සාදාගන්නා ලද පඹයා



රූපය 1.3 පඹයා

**ක්‍රියාකාරකම**

හේන් ගොවිතැන ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වගා කළ භෝග | විශේෂ ලක්ෂණ | භාවිත කළ උපකරණ | භාවිත කළ වචන |
|---|---|---|---|
| | | | |

## මඩ ගොවිතැන

හේන් වගාවට අමතරව අතීතයේ වඩාත් ප්‍රචලිතව පැවති වගා ක්‍රමය මඩ ගොවිතැන වේ. කුඹුරු ගොවිතැන, වාරි ගොවිතැන යන නම්වලින් ද මඩ ගොවිතැන හැඳින්වේ. මඩ ගොවිතැන බොහෝ විට වාරි ජලයෙන් සිදු කර ඇත. වැව් අමුණු ඉදි කර ඇළ මාර්ග ඔස්සේ කුඹුරුවලට ජලය ලබාගෙන තිබේ. වර්ෂා ජලයෙන් කුඹුරු වගා කිරීම ද සුළු වශයෙන් සිදු විය.

පවුලක යැපීම සඳහා කුඹුරක් වගා කිරීමට පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් වුවත් ජනගහනය වැඩි වීමත් සමග වගා කළ බිම් ප්‍රමාණය ද වැඩි කිරීමට සිදු විය. අනුරාධපුර රාජධානි අවධියේ සෑම ගමකට ම එක් වැවක් බැගින් තිබූ බව සොයාගෙන ඇත. මෙම වැව්, ගම් වැව් යනුවෙන් හඳුන්වයි. පැරණි ශිලා ලිපිවල වැව් හමික, වපි හමික ලෙස හඳුන්වා ඇත්තේ ගම් වැව් තැනවූ අය හෝ එබඳු වැව් අයිතිව සිටි අය විය හැකි ය.

විශාල වශයෙන් කුඹුරු වගා කිරීමට ගම් වැව්වල ජලය ප්‍රමාණවත් නොවීම නිසා රජවරු විශාල වැව් අමුණු ඉදි කළහ. මින්නේරිය වැව තැනවූ මහසෙන් රජු පසු කාලයේ දී මින්නේරි දෙවියන් ලෙස ප්‍රචලිත වූයේ වාරි කර්මාන්තයට කළ විශිෂ්ට සේවය නිසා ය.